දිවයිනේ රූපලාවණ්‍යාගාර වලින් භාණ්ඩ සොරකම් කළ බවට චෝදනා මත කාන්තාවක් අත්අඩංගුවට ගැනීමේ පුවත, පුවත්පත් වාර්තා දෙකක් (මැයි 12, 2023) ඔස්සේ දැක්වී තිබූ ආකාරය මෙසේය.

* "ෆැෂන් කරන්න හොරකමේ ගිය සුරූපිනිය කොටු" - ලංකාදීප
* "රූපලාවණ්‍යාගාරවල භාණ්ඩ සොරකම් කළ තරුණිය අත්අඩංගුවට" - දිනමිණ

1) ඔබ සිතන ලෙසට, ලංකාදීප පුවත මගින්, අදාළ කාන්තාව "සුරූපිනියක්" ලෙසින් හඳුන්වා දීම, කෙතරම් පුවතට අදාළ කරුණක් වන්නේ ද?

2) දිනමිණ පුවත එසේ බාහිර ස්වරූපය ඔස්සේ සැකකාරිය හඳුන්වා දී නොමැත්තේ මන්ද?

3) පුරුෂ පාර්ශවයේ සැකකරුවන් සම්බන්ධයෙන් ද මෙවැනි හැඳින්වීම් දක්නට ලැබෙන්නේ ද? එසේ නොවන්නේ නම්, කාන්තාවන් සම්බන්ධ වාර්තාකරණයේදී පමණක් මෙවැනි විශේෂණයන් භාවිතය තුලින් කාන්තාව ලිංගික භාණ්ඩයක් ලෙසින් හැඟවුම්කරණය කිරීම් සිදු නොවන්නේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

